# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.17 පැය 2100 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 82 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**හෙරොයින් සහ ගිනි අවි 02 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.01.17 වන අද දින අළුයම් කාලයේ මාතර පොලිස් වසමේ පොකුණුහේන ප්‍රදේශයේදී, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ මාතර උප ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 900 ක්, මෙරට නිෂ්පාදිත බෝර 12 ගිනි අවියක් හා එම පතරොම් 02 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන පොකුණුහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුගෙන් සිදුකල ප්‍රශ්ණ කිරීමේදී, අනාවරණය වූ තොරතුරු මත වැවහමන්දූව ප්‍රදේශයේ නිවසක් පරීක්ෂා කර එම නිවසේ සඟවා තිබූ ටී56 ගිනි අවියක්, එම පතරොම් ගැබ් දෙකක් හා එම ජීව පතරොම් 60 ක් සමඟ තවත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 24 ක් වන වැවහමන්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එම සැකකරුගෙන් සිදුකල ප්‍රශ්ණ කිරීමේදී, මෙම ටී56 ගිනි අවිය සඟවා තැබීම සඳහා ඉහත පළමු සැකකරු විසින් ඔහුට ලබාදී ඇති බවට අනාවරණය වී ඇත. සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගත් දේපළද සමඟ මාතර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත. මාතර පොලිසිය හා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

අත්අඩංගුවට ගත් ගිනි අවි වල ඡායාරූපයක්




පොලිස් මාධ්‍ය කොට්ඨාසය